# 17 කන්කලු වෙණ නද

සවන්දීම අප පුහුණු කරගත යුතු ඉතා වැදගත් කුසලතාවකි. විශේෂයෙන් යහපත් හා ඵලදයී සමාජ සමස්බන්ධතා පවත්වා ගැනීම සඳහා මේ කුසලතාව දියුණු කර ගැනීම අත්‍යවශ්‍ය වේ.

ගුත්තිල කාව්‍යය පිළිබඳ ගුවන්විදුලි මාධ්‍යයෙන් විකාශය වූ වැඩසටහනක් මෙම පාඩමෙහි ඇතුළත් වේ. එමගින් ගුත්තිල කාව්‍යයේ ඇතුළත් වර්ණනාවල උසස් බව සහ කවියාගේ ප්‍රතිභාව පිළිබඳ ඔබට අවබෝධයක් ලබා ගත හැකි ය.

*ගායක පිරිස* :

**දිය දිය ගොස පළ කෙරෙමින් සපැ මිණි**
**ගිය ගිය තැන ඉස්වා රන් මුතු මිණි**
**ගිය ගිය දිය නද එන මෙන් ගෙන මිණි**
**සිය සිය ගුණයෙන් වෙණ නද නික් මිණි**

*නිවේදක* : ආයුබෝවන්!
ඔබ ඒ අසා සිටියේ ගුත්තිල කාව්‍යයේ ඇතුළත් කවියක්. ගුත්තිල කාව්‍යය පිළිබඳ තොරතුරු ගෙන එන සජීවී ගුවන්විදුලි සාකච්ඡාව ආරම්භ කරන මේ මොහොතේ පොතක වගතුග පවසන **"නැණ පහන"** අඩ හෝරාව හා රැඳී සිටින මෙන් ශ්‍රාවක ඔබ සැමට ආරාධනා කරනවා.

මේ වැඩසටහන ඵලදයී කිරීම සඳහා අපගේ ආරාධනය පිළිගෙන මෙහි පැමිණි ආචාර්ය ගුණපාල ජයසුන්දර මැතිතුමාවත්, ආචාර්ය කුසුම් බාලසූරිය මැතිනියත් ගෞරවයෙන් පිළිගන්නවා.

*ජයසුන්දර මහතා* : ආයුබෝවන්!

*බාලසූරිය මහත්මිය* : ආයුබෝවන්!

*නිවේදක* : ගුත්තිල කාව්‍යය පිළිබඳ හඳුනා ගැනීම කාටත් ප්‍රයෝජනවත් විය හැකියි. ඒ නිසා මම පළමුවෙන් ම ගුණපාල ජයසුන්දර මහතාට ආරාධනා කරනවා ගුත්තිල කාව්‍යය පිළිබඳ හැඳින්වීමක් කරන ලෙස.

*ජයසුන්දර මහතා* : ගුත්තිල කාව්‍යය, සිංහල සාහිත්‍යයේ ස්වර්ණමය යුගය ලෙස සැලකෙන කෝට්ටේ යුගයේ දී රචනා වූවක්. ඒ වගේ ම ගුත්තිල

ජාතක කතාව පදනම් කරගෙන නිර්මාණය කරන ලද කාව්‍ය ග්‍රන්ථයක්. වෑත්තෑවේ හිමියන් විසින් රචිත ගුත්තිල කාව්‍යය පද්‍ය 511කින් යුක්තයි. කෝට්ටේ යුගයේ දී රචනා වූ කාව්‍ය නිර්මාණ අතර ගුත්තිල කාව්‍යයට හිමි වන්නේ සුවිශේෂ ස්ථානයක්. ඒ වගේ ම ගුත්තිල කාව්‍යය ප්‍රතිභාපූර්ණ කවියෙකුගේ නිර්මාණයක් ලෙස අවිවාදයෙන් පිළිගන්නවා.

*නිවේදක* : ජයසුන්දර මහතාණෙනි, මෙම කාව්‍ය ග්‍රන්ථයෙන් කතුවරයාගේ රුචි අරුචිකම් පිළිබඳ වැදගත් තොරතුරු හෙළිවනවා නේ ද?

*ජයසුන්දර මහතා* : ඔව්... ගුත්තිල කවියාගේ නිහතමානි බව ප්‍රකට කරුණක්. සම්මත කවිසමය අනුව යමින් වෙනත් පැරණි කවීන් මුනිඳු පිදුවේ පරසතු මලින්. වෑත්තෑවේ හිමියන් තම නිහතමානි ගුණය ප්‍රකට කරමින් "අතීතයෙහි උතුම් මහ වියතුන් කී බුදු ගුණ මම මගේ දැනුමේ ප්‍රමාණයට කීමේ කවර වරදක් වේ ද?" යනුවෙන් පවසයි.

*ගායක පිරිස* :

**පරසතු මලින් පුද**
**ලද මුනි සඳුට දිය නඳ**
**වන පස මලින් පුද**
**කළැ'යි පවසනු කවර වරද ද**

*ජයසුන්දර මහතා* : පරසතු මල් දිව්‍ය ලෝකයේ පිපෙන පුෂ්ප විශේෂයක්. කවියා ඒ මල් උපයෝගි කොට ගෙන පවසන්නේ ඊට වඩා ශ්‍රේෂ්ඨ අදහසක්. හැකියාව ඇති අය එවන් මාහැඟි මල්වලින් බුදුන් පුදනවා. මට එවැනි මල් නැහැ. ඇත්තේ කැලයේ තිබෙන මල් පමණයි. පරසතු මලින් පිදූ බුදුන් වහන්සේ කැලෑ මලින් පිදීම බුද්ධ ගෞරවයට හානියක් නොවන බව කවියා පවසනවා. උන්වහන්සේගේ නිහතමාන බවත් මෙහි දී හොඳින් පෙනෙනවා එසේ ම පැරණි කවීන් මෙන් තමන් අලංකාරවාදය අනුව කාව්‍ය නිර්මාණයට අදහස් නො කරන බවත් මෙහි දී හඟවනවා.

*නිවේදක* : ගුත්තිල කාව්‍යයේ සන්දර්භය පිළිබඳ ව ඔබතුමාට කුමක් කිව හැකි ද?

*ජයසුන්දර මහතා* : ගුත්තිල කාව්‍යයේ, ගුත්තිල ජාතකයේ අතීත කතාව මෙන් ම වර්තමාන කතාවත් ඇතුළත් වෙනවා. ඒ වගේ ම සිද්ධි අනුපිළිවෙළින් කවියට නගා තියෙනවා. මේ සිද්ධි කවියට නැගීමේ දී සරල කවි බස යොදා ගැනීම පිළිබඳ ව විශේෂයෙන් සඳහන් කළ යුතු වෙනවා. මෙහි

ඇතුළත් වර්ණනා කෙටියි. කතා විකාසනය මැනැවින් ගොඩනගා තියෙනවා. මේ නිසා ගුත්තිල කාව්‍යය සිංහල සාහිත්‍යයේ ඉතා ප්‍රසිද්ධ හා ජනප්‍රිය පොත් දෙක තුන අතර මුල් තැන හිමි කර ගන්නවා.

*ගායක පිරිස* :

**ගසෙක පැහැය ගවු දෙසියක දිසේ යා**
**මලෙක සුවඳ සිවු සිය ගවු ඇසේ යා**
**ගලෙක මෙළෙක උන් සක් නැබ වැසේ යා**
**නොයෙක එ සග සැප පවසම් කෙසේ යා**

*ජයසුන්දර මහතා* : දෙව්ලොව ඇති ශ්‍රී විභූතිය පිළිබඳවයි කවියා එසේ දක්වන්නේ. මෙහි දී පැහැදිලි වෙනවා වැත්තෑවේ හිමියන් පද්‍ය රචනයේ දී උපයෝගි කරගෙන තියෙන්නේ සරල බස් වහරක් බව. සකු කවි සමයට අනුගත නොවී ජන කවියකු මෙන් හැඟීම් ඉදිරිපත් කිරීමට කවියා සමත් වී තිබෙනවා. එය මේ කෘතියේ දක්නට ඇති අපූර්ව ලක්ෂණයක්.

*නිවේදක* : හොඳයි.... ඔබතුමාගේ අදහස්වලට ස්තුතිවන්ත වන අතර ම ගුත්තිලයේ විවිධ අවස්ථා නිරූපණය කර ඇති ආකාරය ගැන තම අදහස් ප්‍රකාශ කිරීමට කුසුම් බාලසූරිය මැතිනියට ආරාධනා කර සිටිනවා.

*බාලසූරිය මහත්මිය* : ගුත්තිල කාව්‍යයේ විවිධ සිදුවීම් පාදක කොටගෙන කවියා මැනවින් අවස්ථා නිරූපණයෙහි යෙදී තිබෙන බව කියන්න පුළුවන්. අපි දැන් කවියකට සවන් දෙමු.

*ගායක පිරිස* :

**අඳ මවු පිය දෙදෙන**
**ඔහු වයන බව නොම දැන**
**කතී වෙණ මීයන**
**සු සූ යැයි අත ගැසූ සැකයෙන**

*බාලසූරිය මහත්මිය* : ගුත්තිල පඬිතුමාගේ නිවසට මූසිල පැමිණි අවස්ථාවේ වීණාව සුරතට ගන්නේ නිරායාසයෙන්. ඉන් පසු ව ඔහු වීණාව වැයීමට පටන් ගන්නවා. එහි හඬ ඇදුරුතුමාගේ අන්ධ දෙමාපියන්ට ඇසෙනවා. මේ අවස්ථාවේ තමන්ගේ පුතාගේ වීණාව මීයන් කති'යි සිතන ඔවුන් 'සු සූ' කියා අතගසනවා. කවියා මූසිලගේ පැමිණීමේ අවස්ථාව මෙන් ම ඔහුගේ වීණා නාදයේ අමිහිරි බව මෙයින් පෙන්වා දෙනවා.

ගායක පිරිස :

| | |
|---|---|
| **මන් මත් කරවන දන මුළු** | **දෙරණා** |
| **රසවත් වන වෙණ නද නඳ** | **කරනා** |
| **සවනොත් සඳ පුරඟන ලොබ** | **දියුණා** |
| **නොදනිත් දරුවන් ඇකයෙන්** | **වැටුණා** |

බාලසූරිය මහත්මිය : ගුත්තිල මූසිල වීණා වාදය පැවැත්වෙන අවස්ථාවේ පරිසරයේ සිදු වූ විවිධ වෙනස්කම් අපූර්වත්වයෙන් යුතු ව ඉදිරිපත් කිරීමට කවියා ගත් උත්සාහය මෙහි දී පැහැදිලි වෙනවා. සමස්ත මිහිතලයෙහි ම ජනසිත් කුල්මත් කරවන, ආනන්දජනක වූ වීණා නාදය ඇසුණු විට පුර කාන්තාවන්ගේ ඇකයෙහි සිටි දරුවන් වැටුණ බව ඔවුන් නොදත් බවයි කවියා පවසන්නේ. මවකට තමන්ගේ දරුවා තරම් වටිනා, ආරක්ෂා කළ යුතු තවත් මහගු සම්පතක් නැහැ. නමුත් වීණා නාදය පැවැත්වෙන අවස්ථාවේ එහි තිබූ මිහිරි බව වඩා මතුකර පෙන්වීම සඳහායි, කවියා මෙම අපූර්ව වර්ණනාව යොදාගෙන තිබෙන්නේ. මෙබඳු තවත් වැදගත් අවස්ථා තියෙනවා. උදේනි පුරයේ දී මූසිලට වෙළෙඳුන් හමුවීම, මූසිල රජුගෙන් සමාන වැටුප් ඉල්ලා සිටීම හා මූසිලගේ පරාජය ආදිය මෙහි දී සැලකිය හැකියි.

නිවේදක : සංවාදාත්මක ස්වරූපයක් පැවැතීම ගුත්තිල කාව්‍යයේ අගය ඔප්නැංවීමෙහි ලා වැදගත් හේතුවක් ලෙස සැලකෙනවා. ඒ පිළිබඳ ඔබතුමියගේ අදහස් දැනගැනීමට කැමතියි.

බාලසූරිය මහත්මිය : ගුත්තිල කාව්‍යයේ අවස්ථා කිහිපයකදී ම කටවහරින් යුතු ව දෙබස් ඉදිරිපත් කරන ආකාරයෙන් කවි ලියැවී තියෙනවා. මූසිල වෙළෙඳුන් ඉදිරියේ වීණාව වාදනය කළ අවස්ථාව වගේ ම ගුත්තිල ඇදුරුතුමාගේ නිවසට පැමිණි අවස්ථාව කවියට නගා ඇත්තේ සංවාදාත්මක ස්වරූපයෙන්. බරණැස් නුවර සිට උදේනි නුවරට ගිය වෙළෙඳුන් පිරිසට වීණා වාදනයක් ශ්‍රවණය කිරීමට අවශ්‍ය වෙනවා. මෙහි දී මූසිල නම් ගාන්ධර්වයා වෙළෙඳුන් ඉදිරියට පමුණුවනවා. ඔහු තම උපරිම කුසලතා ප්‍රදර්ශනය කළත්, වෙළෙඳුන් සතුටට පත් වුණේ නැහැ. මෙහි දී මූසිල මේ ආකාරයට අසනවා.

ගායක පිරිස :

| | |
|---|---|
| **නො මිහිරි ද මේ** | **වෙණ** |
| **ඇසුහු ද මෙයින් වැඩි** | **වෙණ** |
| **නැතහොත් නැත** | **නුවණ** |
| **කියව නොසතුටු වන්ට** | **කාරණ** |

*බාලසූරිය මහත්මිය* : මූසිල වෙළෙඳුන් ඉදිරියේ කළ වීණා වාදනය වර්ණනා කොට ඇත්තේ ඒ ආකාරයෙන්. මේ වීණා වාදනය අමිහිරි ද? මීට වඩා මිහිරි වීණා වාදනයක් අසා තියෙනවා ද? එසේ නැතිනම් නුවණ නැති ද? අසතුටු වෙන්න කරුණු කියන්න ආදි වශයෙන් සංවාදාත්මක ලක්ෂණ පද්‍යය තුළ දකින්නට තිබෙනවා.

*ගායක පිරිස* :

| | |
|---|---|
| **සගය ඒ** | **ඇදුරා** |
| **කිසි කාරියෙක** | **නුදුරා** |
| **ගියෙය නොව** | **බැහැරා** |
| **කිවුය දැන් දැන් එතියි** | **ඉඳුරා** |

*බාලසූරිය මහත්මිය* : මූසිල ගාන්ධර්වයා ගුත්තිල පඬිතුමාගේ නිවසට පැමිණ එතුමා පිළිබඳ ව විමසූ අවස්ථාවේ ගුත්තිල පඬිතුමාගේ දෙමාපියන් දෙන පිළිතුරයි. ගුත්තිල පඬිතුමා වැඩි ඈතකට නො ගිය බවත්, නුදුරු තැනෙක යම්කිසි කාර්යයක් සඳහා ගිය බවත්, ඒකාන්තයෙන් ම දැන් එන බවත් එතුමාගේ දෙමාපියන් පවසනවා. ඔවුන් එය පවසන්නේ සංවාදාත්මක අවස්ථාවක් ප්‍රකාශ කරන ආකාරයෙන්. මේ නිදසුන්වලින් ගුත්තිල කාව්‍යයේ ඇති සංවාදාත්මක හා සජීවී බව හොඳින් පැහැදිලි වෙනවා.

*නිවේදක* : ගුත්තිල කාව්‍යය වර්ණනා රාශියකින් යුක්ත වෙනවා. බඹදත් රජ, බරණැස් නුවර, උදේනි පුර සැණකෙළිය, ගුත්තිල ඇදුරු, සුරඟන රැඟුම, වාද මණ්ඩපය සැරසීම ආදි විවිධ වර්ණනා මෙහි ඇතුළත් වෙනවා. එයින් වර්ණනා කිහිපයක් පැහැදිලි කර දෙන ලෙස ජයසුන්දර මහතාගෙන් ඉල්ලා සිටිනවා.

*ජයසුන්දර මහතා* : හොඳයි... මම මේ අවස්ථාවේ මුලින් ම සැණකෙළි වර්ණනාව පිළිබඳ පැහැදිලි කරන්නම්.

*ගායක පිරිස* :

| | |
|---|---|
| **සඳවා සුදු වැලි** | **පිවිතුරු** |
| **බඳවා රන් දද** | **පියකරු** |
| **සිටුවා දොර දොර** | **රඹතුරු** |
| **තබවා පුන්කුඹු** | **විසිතුරු** |



*ජයසුන්දර මහතා* : උදේනි පුරය සැණකෙළි ස්වභාවයක් උසුලන අවස්ථාවේ එම පුරය ඉතා ම අලංකාර ව සරසා තිබූ ආකාරය පිළිබඳ මේ කවියෙන් පැවසෙනවා. මෙහි සඳහන් සුදුවැලි, කොඩි, රඹතුරු, පුන් කලස් ආදිය උත්සව අවස්ථාවල දී යොදා ගන්නා දේ. ඒවා යොදාගෙන නගරය ආකර්ෂණීය ව සරසා ඇති ආකාරයයි පැවසෙන්නේ. මේ වැනුමේ කවි මගින් සහෘදයාගේ සිතේ '**සැණකෙළියක**' ස්වරූපය මැවීමට කවියා සමත් වී තියෙනවා. දැන් අපි සුරඟන වැනුමේ අවස්ථාවක් වර්ණනාවට හසු කර ඇත්තේ කෙසේද' යි බලමු.

| | | | |
|---|---|---|---|
| *ගායක පිරිස* | : | **පුන් මදාරා මල්දමින් මුදු දිගු සුනිල් වරලස** | **ගොතා** |
| | | **මන් මදා කිතුලිය ලෙසින් උර තුර සරා දිලි මුතු** | **ලතා** |
| | | **මන් නඳා වන මිණි මෙවුල් නද වෙණ නදින් එක්කොට** | **ඉතා** |
| | | **උන් එදා දුන් රඟ දුටොත් තව සක් සැපත් කවරෙක්** | **පතා** |

*ජයසුන්දර මහතා* : මෙහි දී කවියා ඉදිරිපත් කරන්නේ සුරඟනන්ගේ රංගන විලාසයයි. මෙහි සඳහන් සුරඟනන් රංගනයේ යෙදෙන්නේ පිපුණ මදාරා මල්වලින් නීල වර්ණ කෙස් කලඹ ගොතා ගෙන ය. ඒ වගේ ම උර පෙදෙස සරසා ඇති ආකාරය පිළිබඳවත් කවියා මෙහි දී වර්ණනා කරනවා. මේ රංගන විලාසය දුටු කවරෙක් සක් සැපත ප්‍රාර්ථනා කරත් ද? කියා කවියා අසනවා. වීණා නාදය පැවැත්වූ අවස්ථාවේ දෙව්ලොවින් බට සුරඟනන්ගේ රංගන විලාසය මෙහි දී මැනවින් වර්ණනයට හසු කර ඇති බව කියන්න පුළුවන්.

*නිවේදක* : ගුත්තිල කාව්‍යයේ ප්‍රධාන චරිත ගුත්තිල ඇදුරුතුමා හා මූසිල ගාන්ධර්වයායි. කවියා ගුත්තිල ඇඳුරුතුමාගේ චරිතය වගේ ම මූසිලගේ චරිතය දෙසත් සානුකම්පිත ව බලා තියෙනවා. ඒ පිළිබඳ ඔබතුමියට පවසන්න ඇත්තේ මොන වගේ අදහසක් ද?

*බාලසූරිය මහත්මිය* : ඔව්... වැත්තෑවේ හිමි ගුත්තිල ඇදුරුතුමා කෙරෙහි ගෞරවයෙන් බලන්න සහෘදයා යොමුකර තියෙනවා. ඒවගේ ම මූසිල ගාන්ධර්වයාගේ චරිතයත් සානුකම්පිත ආකාරයෙන් නිරූපණය කර ඇති බව පවසන්න ඕනෑ.

*ගායක පිරිස* :

| | |
|---|---|
| **ඉඳ ඉඳ එක** | **වෙහෙර** |
| **විඳ විඳ දහම්** | **මනහර** |
| **සිඳ බිඳ දුක්** | **සසර** |
| **අහෝ දෙව්දත් නුදුටි** | **මොක්පුර** |

*බාලසූරිය මහත්මිය* : මෙම කවිය ඇසෙන විට අපට මූසිල තුළ පැවැති වෙනත් ගති ලක්ෂණ මතකයට එන්නේ නැහැ. 'අහෝ දෙව්දත් නුදුටි මොක්පුර' යනුවෙන් කවියා පවසන්නේ අනුකම්පා සහගත හැඟීමෙන්. දැන් අපට පැහැදිලි වෙනවා ගුත්තිල පඬිතුමා කෙරෙහි වගේ ම මූසිල ගාන්ධර්වයා කෙරෙහිත් කවියා මානව දයාවෙන් යුතු ව බලා ඇති බව.

*නිවේදක* : අවසාන වශයෙන් සිය සිය ගුණයෙන් නික්මුණු වීණා නාදය දසත පැතිරී යද්දී එම පරිසරයේ පැවැති ස්වභාවය පිළිබඳ අප සාකච්ඡා කළ යුතු වෙනවා.

*බාලසූරිය මහත්මිය* : ගුත්තිල ඇදුරුතුමාගේ වීණාවේ නාදය දසත පැතිරී ගිය අවස්ථාවේ පැවැතියේ චමත්කාරජනක ස්වභාවයක්. පරිසරයේ ඇති විවිධ අවස්ථා මාර්ගයෙන් වීණා නාදය ඉතා ම මිහිරි බව පැවසීමට කවියා උත්සාහ කර තිබෙනවා. දැන් අපි එවැනි තැන් කිහිපයක් සලකා බලමු.

*ගායක පිරිස* :

**පන්සිළු වීණා නද පසු බැස් වූ**
**මන් පිනවන වෙණ නදයෙන් තොස් වූ**
**නන් දන කැන් දුටුවද බිය සිස් වූ**
**මින් රළවුත් ගං වෙරළට රැස් වූ**

*බාලසූරිය මහත්මිය* : මෙහි පන්සිළු යනුවෙන් සඳහන් වන්නේ පංචශිඛ හෙවත් ශක්‍ර දෙවියන්ගේ වීණා වාදකයා. එම වීණාවේ නාදයටත් වඩා ගුත්තිල ඇදුරුතුමාගේ වීණාවේ නාදය මිහිරි වූ ආකාරයයි කවියා පවසන්නේ. ඒ මිහිරි බව නිසා ජනයාගේ සිත් ඒ වෙතට ම යොමු වී තිබුණා. මාළු රංචු කිසි ම බියක් නැති ව ගං වෙරළට රැස් වූ බව පැවසීමෙන් කවියා වීණා නාදයේ මිහිරි බව වඩා හොඳින් අපට අවධාරණය කර පෙන්වනවා.

*ගායක පිරිස* :

**සතොස් කරන වීණා නද ඇසුමට**
**නොගොස් සිටින පිල්බර ගණ ගොදුරට**
**වෙසෙස් රුවින් තම මැව්වත් බඹ හට**
**සඳැස් සවන් නො කළැ'යි වූ නොසතුට**

*ජයසුන්දර මහතා* : මෙහි දී කවියා ඉදිරිපත් කරන්නේ වීණා නාදය අසා සිටින මොනර සමූහයා පිළිබඳ අපූර්ව නිර්මාණයක්. මොනර පිල්වල ඇස් වැනි රූප රාශියක් දක්නට ලැබෙනවා. කවියා ඒවා ඉස්මතු කරමින් පෙන්වා දෙන්නේ මොනරුන්ගේ රූපය මහා බ්‍රහ්මයා විශේෂ ස්වරූපයකින් මවා ඇති බව. පිල්වල ඇති එම සඳැස් සවන් බවට පත් කළේ නැති නිසා මොනරුන් අසතුටෙන් පසු වෙනවා. පිල් කලඹේ ඇති සඳැස් සියල්ල සවන් බවට පත් වී තිබුණා නම් ඒ සියල්ලෙන් ම වීණා නාදය ඇසීමට මොනරුන්ට අවස්ථාව ලැබෙනවා. මොනරුන් අසතුටෙන් පසුවන බව කීමෙන් කවියා මතු කරන්නේ වීණා නාදයේ මිහිරි බව යි.

**නිවේදක** : ගුත්තිල කාව්‍යය සිංහල සාහිත්‍ය වංශයේ විශිෂ්ට නිර්මාණ අතරින් එකක්. එහි සාහිත්‍යමය අගය හා කවියාගේ කවි ශක්තිය පිළිබඳ අගනා තොරතුරු ශ්‍රාවක ඔබ සැමට ගෙන ආ **'නැණ පහන'** අඩ හෝරාව සාර්ථක කර ගැනීමට සහාය දුන් ආචාර්ය ගුණපාල ජයසුන්දර මැතිතුමාටත්, ආචාර්ය කුසුම් බාලසූරිය මැතිනියටත් ගායනයෙන් සහාය වූ දූදරුවන්ටත් බෙහෙවින් ම ස්තුතිවන්ත වෙමින් අදට සමුගන්නවා.

## අරුත් පැහැදිලි කිරීම

| | | |
|---|---|---|
| අඩ හෝරාව | - | පැය භාගය |
| ආනන්දජනක | - | සතුට උපදවන |
| කිතුලිය | - | කීර්තිය නමැති ලතාව/වැල |
| තෙපලන | - | වචන ප්‍රකාශ කරන |
| දිය | - | ලෝකය/ජය |
| නන් දන | - | නොයෙක් ජනයා |
| නිරායාසයෙන් | - | වෙහෙසක් නැති ව |
| පන්සිළු | - | පංචශිඛයා (ශක්‍රයාගේ ගාන්ධර්වයා) |
| පිල්බර ගණ | - | මොනර සමූහයා |
| පුන්කුඹු | - | පුන් කලස් |
| මන්මදා | - | අනංගයා |
| මාහැඟි | - | ඉතා වටිනා |
| රන් දද | - | රත්රන් කොඩි |
| රඹතුරු | - | කෙසෙල් ගස් |
| වෙසෙස් | - | විශේෂයෙන් |
| සගය | - | යහළුව |
| සඳැස් | - | මොනර පිලෙහි තිබෙන ඇස් වැනි වර්ණවත් ස්වරූපය |
| සවනොත් | - | කනට වැටුණු |
| සහෘදයාගේ | - | සමාන හදවත් ඇත්තා. |

## ක්‍රියාකාරකම 01



(i) පන්තියේ සිසුන් කණ්ඩායම් වී මේ පාඩම කියවන්න. එක් කණ්ඩායමක් සංවාදයේ යෙදෙන විට අනෙක් අය අසා සිටින්න.

## ක්‍රියාකාරකම 02

**පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(i) ගුත්තිල කාව්‍යය රචනා කිරීම සඳහා පදනම් කර ගත් ජාතක කතාව කුමක් ද?
(ii) ගුත්තිල කාව්‍යය ලියවුණේ කිනම් යුගයක ද?
(iii) වැත්තෑවේ හිමියන් සතු වූ ගුණාංග දෙකක් දක්වන්න.
(iv) මූසිල පැමිණි අවස්ථාවේ ගුත්තිල පඬිතුමාගේ දෙමාපියන් ක්‍රියා කළ ආකාරයෙන් පාඨකයාට ඇති වන හැඟීම් මොනවා ද?
(v) ගුත්තිල පඬිතුමා වීණාව වයන අවස්ථාවේ සිදු වූ විශේෂ සිදුවීම් දෙකක් ලියන්න.

## ක්‍රියාකාරකම 03

(i) පන්තියේ සිසුන් කණ්ඩායම් කිහිපයකට බෙදී මෙම පාඩමේ සඳහන් කවි දෙකක් හෝ තුනක් තෝරාගෙන ඒවායේ අර්ථ පිළිබඳ සාකච්ඡා කරන්න.
(ii) ඉන් පසු ව පන්තිය ඉදිරියේ එම කවිවල අර්ථ ප්‍රකාශ කරන්න.
(iii) ගුත්තිල පඬිතුමා හා මූසිල ගාන්ධර්වයා හමු වූ අවස්ථාව පිළිබඳ ව කල්පිත සංවාදයක් ඉදිරිපත් කරන්න.

## ක්‍රියාකාරකම 04

**පහත සඳහන් පද වෙනුවට පාඩමේ යෙදී ඇති පද තෝරා ලියන්න.**

(i) නිරහංකාර -
(ii) වෑයම -
(iii) වටිනා -
(iv) පොළොවෙහි -
(v) ගුරුතුමා -
(vi) දැකීමට ප්‍රිය උපදවන -
(vii) ප්‍රසිද්ධ -
(viii) ඇරයුම -
(ix) මධුර -
(x) දෙවඟනන් -

**පහත සඳහන් පදවලට විරුද්ධාර්ථවත් පද ලියන්න.**

(i) සරල -
(ii) විශේෂ -
(iii) අමිහිරි -
(iv) පැමිණ -

(v) සජීවී -
(vi) සානුකම්පිත -
(vii) නිරායාස -
(viii) ප්‍රධාන -
(ix) උත්සාහය -
(x) පැහැදිලි -

## ක්‍රියාකාරකම 05

**පහත සඳහන් පද්‍ය පාඨවල හා වාක්‍ය ඛණ්ඩවල තද කළු අකුරින් මුද්‍රිත පද දෙස බලන්න.**

- මින් **රළවුත්** ගං වෙරළට රැස් වූ
- **සවනොත්** සඳ **පුරඟන** ලොබ දිවුණා
- ගුත්තිල **ඇදුරුතුමාගේ** වීණාවේ නාදය **දසත** පැතිර ගිය අවස්ථාවේ

**ඒවා පද දෙකක් එකතු වීමෙන් සෑදී ඇත.**

| | | | | |
|---|---|---|---|---|
| රළ | + | අවුත් | = | රළවුත් |
| සවන | + | ඔත් | = | සවනොත් |
| පුර | + | අඟන | = | පුරඟන |
| ඇදුරු | + | උතුමා | = | ඇදුරුතුමා |
| දස | + | අත | = | දසත |

**පහත සඳහන් ඡේදයේ පද දෙකක් එකතු වීමෙන් සෑදී ඇති පද තෝරා ගෙන ලියා ඒ පද සෑදුණු ආකාරය ඒ ඉදිරියෙන් ලියන්න.**

තාත්තා ගෙදර එන විට පොත් කිහිපයක් ගෙනැවිත් තිබුණේ ය. මම ඒවා එකිනෙක කියවා බැලුවෙමි. ඒවායේ තිබූ විවිධාකාර චිත්‍ර ද මගේ සිත් ගත්තේ ය. එහි තිබූ ගුත්තිල කාව්‍යයේ බරණැස් නුවර රජතුමා පිළිබඳ ව පැවසීමට උපමාලංකාර යොදා තිබුණි. සුරඟන වැනුම කියවන විට මගේ මනසේ විචිත්‍රාකාර රූප ඇඳුණි. කාමරයට යනෙන තාත්තා පොත් කියවන මදෙස බලා මුවගට සිනාවක් නගා ගත්තේ ය.

## ක්‍රියාකාරකම 06

(i) ගුත්තිල කාව්‍යය සොයා ගෙන කියවන්න.
(ii) කෝට්ටේ යුගයේ ලියැවුණු වෙනත් පද්‍ය ග්‍රන්ථ පිළිබඳ ව කරුණු සොයන්න.
(iii) ඒ පොත් අතරින් දෙකක් පිළිබඳ ව සාකච්ඡා කරන්න.
(iv) ගුත්තිල කාව්‍යයේ ඔබ සිත් ගත් අවස්ථාවක් චිත්‍රයට නගන්න.